සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2019

# කතෝලික ධර්මය

07 ශ්‍රේණිය | කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

## I කොටස

- අංක 01 සිට 10 තෙක් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සාමුවෙල් හා රාජාවලිය ග්‍රන්ථවල .................. පිළිබඳ තොරතුරු සඳහන් වෙයි.

ඉහත හිස්තැනට අදාළ පිළිතුර වන්නේ,

(1) ප්‍රධාන දිවැසිවරුන් (2) ලේඛක දිවැසිවරුන්

(3) දේශක දිවැසිවරුන් (4) සුළු දිවැසිවරුන්

02. නාතාන් දිවැසිවරුයාගේ උපමාවෙන් තම වරද වටහාගෙන මනස්ථාපනය වූ රජතුමා වන්නේ,

(1) දාවිත් රජතුමා ය. (2) සලමොන් රජතුමා ය.

(3) සාවුල් රජතුමා ය. (4) පිලාත් රජතුමා ය.

03. බැබිලෝනියේ සිට ඉශ්‍රායෙල් ජනතාවට දෙවියන් වහන්සේගේ පණිවිඩය ප්‍රකාශ කළේ,

(1) ජෙරමියා දිවැසිවරයා ය. (2) යෙසායා දිවැසිවරයා ය.

(3) ආමොස් දිවැසිවරයා ය. (4) එසකියල් දිවැසිවරයා ය.

04. සමිඳාණන් වහන්සේ ද ඔහු පිටතට රැගෙන ගොස්, "අහස දෙස බලා, හැකි නම් ඔබ තාරකා ගණන් කරන්න." මෙලෙස දෙවියන් වහන්සේ ප්‍රකාශ කළේ,

(1) ඊසාක්ට ය. (2) ආබ්‍රහම්ට ය. (3) ජෝශප්ට ය. (4) ජාකොබ්ට ය.

05. 'මා අනුව එන්න. මම ඔබ මිනිසුන් දිනන්නන් කරමි.' යන කැඳවීම කිතුණු අපට ලැබී ඇත්තේ,

(1) ප්‍රසාද ස්නාපනය තුළිනි. (2) පූජකවරය තුළිනි.

(3) දිව්‍ය සත්ප්‍රසාදය තුළිනි. (4) අභිවෘද්ධි ආලේපය තුළිනි.

06. මුල් කිතුණු සභාවේ දොළොස් වන අපෝස්තුළුවරයා ලෙස ගණන් ගනු ලබන්නේ,

(1) ශු. ජාකොබ් මුනිතුමා ය. (2) ශු. මතියස් මුනිතුමා ය.

(3) ශු. ජොහාන් මුනිතුමා ය. (4) ශු. පිලිප් මුනිතුමා ය.

07. පූජාප්‍රසාදීන් වහන්සේලා විවිධ ආශිර්වාදයන් දානය කිරීමේදී භාවිත කරන පොත වන්නේ,

(1) උපමා කතා සංග්‍රහය (2) යැදුම් සංග්‍රහය

(3) සභා නීති සංග්‍රය (4) සරල පිළිවෙත් සංග්‍රහය

08. රාජගුරුප්‍රසාදීන් වහන්සේලා යටතේ රදගුරු පදවිය තුළ සේවය කරනුයේ,

(1) පැවිදි පූජකවරුය. (2) සහෝදරතුමන්ලා ය.

(3) පදවි පූජකවරුය. (4) තේවාචාරිවරුන් ය.

09. පැවැදිවූවන්ගේ ප්‍රධාන වූ කාර්යභාර්ය වන්නේ,

(1) අනාථ වූ දරුවන් රැකගැනීමයි. (2) දේව රාජ්‍ය ගොඩනැගීමයි.

(3) දිළිඳු, පීඩිත අසරණයින්ට පිහිට වීමයි. (4) රෝගීන්ට ඇප උපස්ථාන කිරීමයි.

10. සත්‍ය ප්‍රකාශ කිරීමටත්, සත්‍යවාදීව ජීවත් වීමටත් අපට උගන්වන පනත වන්නේ,

(1) මව්පියන්ට සංග්‍රහ කරන්න. (2) ජීවිතය විනාශ නොකරන්න.

(3) බොරු සාක්ෂි නොකියන්න. (4) අන්වස්තු ආශා නොකරන්න.

- **අංක 11 - 15 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා ලියන්න.**

11. දෙවියන් වහන්සේ විසින් ලෝකාරම්භයේ දී ස්ථාපිත කරන ලද ශු. බන්ධනය වන්නේ ..................................

12. ප්‍රසාද ස්නාපනයේ දී ........................................................................................................ ආලේප කරනු ලබයි.

13. ශු. පාවුලුතුමා බොරු කීම අත්හැර දමා සත්‍ය කතා කළ යුතු බව අවධාරණය කරන්නේ ..................................................... ලිපියෙන් ය.

14. පූජකවරය ලැබූ පූජාප්‍රසාදීන් වහන්සේ, දෙවියන් වහන්සේ හා දේව ජනතාව අතර ............................................................... ලෙස කටයුතු කරයි.

15. ජනවන්දනාව අර්ථවත් කිරීම සඳහා ගායනයෙන් හා වාදනයෙන් සහය ලබා දෙන්නේ ............................................................... යි.

( ක්‍රිස්මා තෛලය, මධ්‍යස්ථකායා, ප්‍රසාද ස්නාපනය, එපීස, ගීතිකා කණ්ඩායම, ආශිර්වාදකාර බන්ධනයයි.)

- **අංක 16 - 20 දක්වා නිවැරදි වාක්‍යයට (✓) ලකුණද, වැරදි වාක්‍යයට (X) ලකුණද යොදන්න.**

16. 'මා අනුව එන්න.' යනුවෙන් ජේසුස් වහන්සේ කැඳෙවූ ප්‍රථම ශ්‍රාවකයින් ගණන හයකි. ( )

17. මරණාසන්නව සිටින දරුවන්ට හැකි ඉක්මනින් ප්‍රසාද ස්නාපනය ලබා දිය යුතුය. ( )

18. ඥානගෝපාලයන් ලෙස අද හැඳින්වෙන්නේ පූජාප්‍රසාදීන් වහන්සේලා ය. ( )

19. ආශිර්වාදකාර බන්ධනය දානය කරනු ලබන්නේ පූජාප්‍රසාදීන් වහන්සේලා විසිනි. ( )

20. කානා නුවර මගුල් ගෙදර සිද්ධිය තුළින් අපට පෙන්වාදෙන්නේ ජේසුස් වහන්සේ තම මවගේ ඉල්ලීමට කීකරු වූ ආකාරයයි. ( )

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු ලියන්න.**

01. (i) සුළු දිවැසිවරු දෙදෙනෙක් ලියන්න.

(ii) දෙවියන් වහන්සේ හා ආබ්‍රහම් සමඟ සිදුකළ ගිවිසුම ස්ථිර කිරීමට යොදාගත් සතුන් දෙදෙනෙක් ලියන්න.

(iii) ආශිර්වාදකාර බන්ධනය නමැති සක්‍රමේන්තුවේ පාර්ශව දෙක සඳහන් කරන්න.

(iv) ප්‍රසාද ස්නාපනය දානය කිරීමේදී භාවිත කරන ද්‍රව්‍ය දෙකක් ලියන්න.

(v) ජේසුස් වහන්සේ විසින් කැඳවනු ලැබූ ප්‍රථම ශ්‍රාවකයින් දෙදෙනෙක් නම් කරන්න.

(vi) ප්‍රසාද ස්නාපන පොරොන්දු දෙක ලියන්න.

(vii) පැවිදි පූජක නිකායන් දෙකක් ලියන්න.

(viii) සතරවන පනතට අනුව කිතුනු දරුවෙකු ලෙස රට වෙනුවෙන් කළ හැකි යුතුකම් දෙකක් ලියන්න.

(ix) සත්‍යගරුක සමාජයක් ගොඩනැංවීමට ඔබට කළ හැකි දේවල් දෙකක් ලියන්න.

(x) පැවැදි ජීවිතයේ වේදහාර දෙකක් ලියන්න. (ල. 2 x 10 = 20)

02. (i) කිතුනු විවාහයේ ලක්‍ෂණ දෙක ලියන්න. (ල. 02)

(ii) දරුවන්ගෙන් දෙමව්පියනට ඉටු විය යුතු යුතුකම් තුනක් ලියන්න. (ල. 03)

(iii) ශුද්ධවූ පවුලෙන් කිතුනු පවුලකට ලබාගත හැකි ආදර්ශ පහක් ලියන්න. (ල. 05)

03. (i) පූජක නොවන පැවිදි කොටස් දෙක නම් කරන්න. (ල. 02)

(ii) නිර්මල මරිය නිකාය විසින් සිදු කරන දූතික සේවාවන් තුනක් ලියන්න. (ල. 03)

(iii) ගිහියන් විසින් පැවිදිවරුන්ගේ සේවාවන්ට සහය විය හැකි ආකාර පහක් ලියන්න. (ල. 05)

04. (i) ප්‍රසාද ස්නාපනයේ දී කිතුනුවන් ලෙස අප ලබන කැඳවීම් දෙකක් ලියන්න. (ල. 02)

(ii) පොදු පූජකවරයෙන් පැවරෙන වගකීම් ඉටු කිරීමට සහය වන සමිති සමාගම් තුනක් ලියන්න. (ල. 03)

(iii) හත්වන ශ්‍රේණියේ දරුවන් ලෙස ඔබට පොදු පූජකවරය නමැති කැඳවීමෙන් පැවරෙන වගකීම් පහක් ලියන්න. (ල. 05)

05. (i) පදවි පූජකවරු ලබා ගන්නා පොරොන්දු දෙක මොනවාද? (ල. 02)

(ii) පූජකවරයහි ධූර තුන නම් කරන්න. (ල. 03)

(iii) ඔබ මීසම තුළ පූජාප්‍රසාදිතුමන්ලා සිදු කරන සේවාවන් පහක් ලියන්න. (ල. 05)

06. (i) ජේසුස් වහන්සේ තෝරාගත් ගෝලයන් දොළොස් දෙනා හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න. (ල. 02)

(ii) ප්‍රථම ශ්‍රාවකයින්ගෙන් දැකිය හැකි විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (ල. 03)

(iii) කිතුනු කැඳවීම්වලට නිසි ප්‍රතිචාර දැක්වීමට අප කළ යුතු දේවල් පහක් ලියන්න. (ල. 05)

## පිළිතුරු පත්‍රය - I කොටස

01. (3) 02. (1) 03. (4) 04. (2) 05. (1) 06. (2) 07. (4) 08. (3) 09. (2) 10. (3)

11. ආශිර්වාදකාර බන්ධනය
12. ක්‍රිස්මා තෛලයෙන්
13. එපීස
14. මධ්‍යස්ථකයෙක්
15. ගීතිකා කණ්ඩායම්

16. (X) 17. (✓) 18. (✓) 19. (X) 20. (✓)

## II කොටස

01. (i) හොසියා, ජොවෙල්, ආමොස්, ඔබදියා, ජෝනා, මීකා, නාහුම්, හබක්කුක්, ශෙපනියා, හග්ගයි, සෙකරියා, මලාකි.

(ii) තුන් අවුරුදු වැස්සියක, තුන් අවුරුදු එළුදෙනකු, තුන් අවුරුදු බැටළුවෙකු, කොබෙයියකු, පරෙවි පැටවකු

(iii) මනාලයා සහ මනාලිය

(iv) ජලය, පාස්කු ඉටිපහන, සුදු වස්ත්‍ර, ශුද්ධවූ තෛලය

(v) පේදුරු, ඇන්ඩෲ, ජාකොබ්, ජොහාන්

(vi) යක්ෂයා ප්‍රතික්ෂේප කිරීම, දෙවියන් වහන්සේව විශ්වාස කිරීම.

(vii) නිර්මල මරිය නිකාය, ජේසු නිකාය, සිල්වෙස්ත්‍රෝ බෙනදිකාන නිකාය, දිව්‍ය සත්ප්‍රසාදීය නිකාය, ෆ්‍රැන්සිස්කානු තුන්වන නිකාය, ක්ලැරේසියානු නිකාය.

(viii) රටේ පාලකයනට ගරු කිරීම හා ඇගයීම / රටේ ජනතාව සහ නායකයන් වෙනුවෙන් යාච්ඤා කිරීම / රාජ්‍ය හා පොදු දේපළ ආරක්ෂා කිරීම / ස්වභාවික සම්පත් අරපිරිමැස්මෙන් යුතුව භාවිත කිරීම රටේ සිවිල් නීතිය පිළිපැදීම. / රටේ සංවර්ධනය සඳහා කුසලතා දැනුම යෙදවීම රටේ සැමය සඳහා කැපවීම. (පිටු අංක 68)

(ix) සෑම වීටම ඇත්ත කතා කිරීම / අවංක වීම / අසත්‍ය තොරතුරු ප්‍රචාරය නොකිරීම / මා නොදන්නා දේවල් හා පුද්ගලයන් ගැන කතා කිරීම.

(x) දිළිඳුකම, කීකරුකම, ව්‍රත ශුද්ධිය (පිටු අංක 52) (ල. 2 x 10 = 20)

02. (i) ඒකත්වය, අඛණ්ඩත්වය (ල. 02)

(ii) දෙමව්පියන්ට ගරු කිරීම හා කීකරු වීම / දෙමව්පියන්ගේ වැඩවලට උදව් කිරීම /දුක් වේදනා හා අසනීපවලදී පිහිට වීම / වියපත් වූ දෙමව්පියන්ට සැලකීම / තම බාල සොයුරන් රැකබලා ගැනීම / හොඳින් අධ්‍යාපනය ලබා ගැනීම / නිතර දෙමව්පියන් සතුටු කිරීම / සහෝදර සහෝදරියන් සමඟ සාමයෙන් ජීවත් වීම / දෙමව්පියන් සහ සහෝදර සහෝදරියන් වෙනුවෙන් යාච්ඤා කිරීම (පිටු අංක 62) (ල. 03)

(iii) දේව කැමැත්තට හිස නැමීම / අන් අයට පිහිට වීම / පීතෘ සෙනෙහස උතුම් වීම / නීතියට ගරු කරමින් ආදර්ශවත් කිතුනු ජීවිතයක් ගත කිරීම / මව හා පියා දරුවන් කෙරෙහි දක්වන ආදරය / දේව පුත්‍රයා වුවද කීකරු වීම / දෙමව්පියන්ගේ ආශාවන් හා අරමුණු ඉටු කළ යුතු වීම / යහපත් දරුවෙකු ලෙස සමාජයේ ප්‍රසාදය ලබා ජීවත් වීම. (පිටු අංක 64) (ල. 05)

03. (i) පැවිදි සොයුරන් හා පැවිදි සොයුරියන් (ල. 02)

(ii) දිළිඳුනට සුභාරංචිය දේශනා කිරීම, ධර්ම විවේක පැවැත්වීම, මීසම් සේවය, රෝහල් සේවය (ල. 03)

(iii) ඔවුන් හා එක්ව දයාවේ සේවාවල නිරත වීම. / ඔවුන් වෙනුවෙන් යාච්ඤා කිරීම. / ඔවුනට ගරු කිරීම / දේව රාජයය පතළ කිරීමේ කටයුතුවලදී සහාය දැක්වීම / දේව කැඳවීම් වෙනුවෙන් දිරිගැන්වීම / යාච්ඤා කිරීම. (පිටු අංක 54) (ල. 05)

04. (i) එඬේරික (රාජකීය), පූජක, දිවැසිවර (ල. 02)

(ii) ධර්මදූත ළමා සමාජය, පූජා උදව් සමිතිය, ළමා ක්‍රියාකාරී වීරයෝ, ගීතිකා කණ්ඩායම (ල. 03)

(iii) දිවැසිවර - දේව වචනයට සාක්ෂි දැරීම / සත්‍ය ප්‍රකාශ කිරීම / දේව වාක්‍ය කියවීම.
පූජක - එකිනෙකා වෙනුවෙන් යැදීම / පූජා උදව් සමිතියට බැඳී සේවය කිරීම / ජනවන්දනා පිළිවෙත්වලට භක්තියෙන් සහභාගී වීම.
එඬේරික - දහම් පාසල්වල කටයුතුවලට සහභාගි වීම / පාසල්වල නායකත්වය ගනිමින් සේවය කිරීම. (පිටු අංක 52) (ල. 05)

05. (i) කීකරුකම, පූජක බඹසර (ල. 02)

(ii) රාජගුරු, පූජක, තේවාචාරී (ල. 03)

(iii) දිව්‍ය පූජාව පැවැත්වීම / සුවිශේෂ දේශනා කිරීම / සැබෑ එඬේරකු ලෙස මීසම පරිපාලනය කිරීම / දේව ප්‍රසාද නිධාන දානය කිරීම (පූජකවරය හැර) මීසමේ ප්‍රමුඛ ධර්මෝපදේශකයා ලෙස ක්‍රියා කිරීම විවිධ අවස්ථාවල ආශිර්වාද කිරීම. (පිටු අංක 47) (ල. 05)

06. (i) ප්‍රේරිතයෝ, අපෝස්තුලුවරු (ල. 02)

(ii) ජේසුස් වහන්සේගේ වචනයට කීකරු වීම. / සියල්ල අතහැර ජේසුස් වහන්සේ අනුව යෑම. / ජීවිතයේ මුල් තැන ජේසුස් වහන්සේට ලබා දීම. / ජේසුස් වහන්සේ අනුව යමන් ශුභාරංචිය අන් අයට දේශනා කිරීම. (ල. 03)

(iii) ප්‍රථම ශ්‍රාවකයන්ගේ කීකරුකමේ ආදර්ශය අපගේ ජීවිතවලට ද ආදර්ශයක් කර ගත යුතු වීම. / ජීවිතයේ කුමන අවස්ථාවක හෝ අපට ලැබෙන කැඳවීම්වලට ප්‍රතිචාර දැක්වීම. / ජේසුස් වහන්සේගේ වචනයට කීකරු වී අපට පැවරෙන වගකීම් හා යුතුකම් ඉටු කිරීම. / දේව වචනය කියවා මෙනෙහි කිරීම. / දේව වචනයට සවන් දී අන් අයට පහදා දීම. (පිටු අංක 37) (ල. 05)